අමාත්‍යාංශ චක්‍රලේඛ : 03/2021 (i)

මගේ අංකය: SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු, සහ ග්‍රාමීය කර්මාන්ත
ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
07 වන මහල, බටහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

2021.06.16

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්,

සියළුම මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්,

**<u>එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩසටහන</u>**

අමාත්‍යාංශයේ චක්‍රලේඛ 03/2021 ලෙස ඉහත මාතෘකාව යටතේ නිකුත් කල 2021.02.25 දිනැති චක්‍රලේඛයේ 3.1.3 වගන්තිය රටේ දැනට පවතින සෞඛ්‍ය තත්ත්වය හා සංචරණ සීමාව හේතු කොට ගෙන තාවකාලික පියවරක් ලෙස පහත පරිදි සංශෝධනය කරමි.

**3.1.3 "ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු ඇතුළත් ත්‍රි පුද්ගල මණ්ඩලය විසින් සිදුකරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙනුවට විද්‍යා අංශයේ විද්‍යා හා තාක්ෂණ නිලධාරී හෝ සංවර්ධන නිලධාරී හෝ තාක්ෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන සහකාර හෝ විද්‍යා අංශයේ නිලධාරියෙක් නොමැති අවස්ථා වලදී පමණක් වෙනත් සුදුසු නිලධාරියෙකු විසින් ඒක පුද්ගල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලෙස මාර්ගගත (Online) තාක්ෂණය උපයෝගී කරගෙන ප්‍රතිලාභීන් තෝරාගත යුතුය. එමගින් තෝරාගත් ප්‍රතිලාභීන්ගේ නාමලේඛනය සඳහා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ එකගතාවය ලබා ගැනීම ප්‍රමාද වන අවස්ථාවන්හිදී එම ලේඛනය සඳහා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ ගරු සභාපතිවරයාගේ වාචික හෝ ලිඛිත එකගතාවය ලබා ගෙන ඉදිරි කටයුතු කල යුතු වේ. ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා තිර්ණායකයන් ඇමුණුම - 02 හි සඳහන් පරිදි භාවිතා කල යුතුය."**

තවද එම චක්‍රලේඛයෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බව සලකන්න.

එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක,
ලේකම්,
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පිටපත් :-
1) ජනාධිපති ලේකම්
2) අග්‍රාමාත්‍ය ලේකම්
3) ලේකම්, මුදල් අමාත්‍යාංශය
4) ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
5) ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

6) සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
7) සියළුම ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරුන්
8) ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
9) ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
10) විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තුමේන්තුව
11) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තුමේන්තුව
12) අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
13) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
14) අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
15) අධ්‍යක්ෂ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
16) සභාපති, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය